www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරානයට විරුද්ධ නව දැඩි ඇමරිකන් සම්බාධක

## Harsh new US penalties against Iran

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2010 ජුලි 05**

ඇමරිකාව හා ටෙහෙරානය පමනක් නොව ඇමරිකාවේ ආසියානු හා යුරෝපියානු පතිමල්ලවයන් සමග ද ආතතිතය තීව්‍ර කිරීමට හැකියාවක් තිබෙන ඉරානයට විරුද්ධව කොන්ග්‍රස් මන්ඩලය මගින් සම්මත කරනු ලැබූ නීතියට ඇමරිකානු ජනාධිපති බැරැක් ඔබාමා පසුගිය බ්‍රහස්පතින්දා අත්සන් කලේය.

මෙම නීතිය පුලුල් වශයෙන් ඉරානය සමග ව්‍යාපාර කටයුතු කරන විදේශ බැංකු සහ සංගතයන් ඉලක්ක කර ගනී. එම නීති උල්ලංඝනය කරන්නන්ට විරුද්ධව ඇමරිකා එක්සත් ජනපදයට ඒකපාර්ශවීයව දඬුවම් පැමිනවීමට පුලුවන. ඇමරිකානු වෙලඳපලට භාන්ඩ විකිනීම හෝ ඇමරිකානු ආයාත-නිර්යාත බැංකු පහසුකම් ලබා ගැනීම නතර කිරීම නැතිනම් ඇමරිකානු කොන්ත්‍රාත්තු ලබා එවැනි සමාගම්වලට නොදීම මේ අනුව කල හැකිය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය හෝ ඇමරිකානු ආන්ඩුව විසින් තහංචි පනවා තිබෙන ඉරාන සමාගම් සමග ගනුදෙනු කරන ඕනෑම විදේශ බැංකුවකට ඇමරිකන් මූල්‍ය පද්ධතියට ඇතුල් වීම වැලැක්වීම මෙම පූර්ව ඉරාන සම්බාධක, වගකීම් සහ ප්‍රතික්ෂේපන අනපනත් යටතේ පුලුවන. මෙම ලැයිස්තුවට ප්‍රධාන පෙලේ ඇමරිකානු බැංකු, බලශක්ති ක්ෂේත්‍රය සහ ඉස්ලාමීය විප්ලවවාදී භටහමුදා ඒකකය (අයිආර්ජීසී) සමග සබඳකම් පැවැත්වෙන ව්‍යාපාර ඇතුලත් වේ.

ඉරානයට භූමිතෙල්, ඩීසල් විකුනන විදේශ කොම්පැනි මෙම නීතිය මගින් ප්‍රකෝපාකාරී ලෙස ඉලක්ක කර ගනී. එම ගනුදෙනුවලට සම්බන්ධ රක්ෂන සමාගම්, ප්‍රවාහන කරුවන් හා නිෂ්පාදකයන් ද සම්බාධක වලට ඇතුලත් වේ. ඉරානයට විශාල තෙල් සම්පත් තිබුන ද ආයෝජන නොමැති කම නිසා එහි බලශක්ති යටිතල පහසුකම් සහ තෙල් පිරිසිදු කිරීමේ හැකියාව පහත වැටී ඇත. මේ නිසා ඉරානයට බලශක්ති ආනයනය කිරීමට සිදුව තිබේ.

ටෙහෙරානය න්‍යෂ්ටික අවි නිෂ්පාදනය කිරීමට උත්සාහ කරන බවට වොෂින්ටනය චෝදනා කරයි. ගිය මාසයේ දී එක්සත් ජනපදය සහ ඇගේ යුරෝපා සහායකයින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය තුල ඉරානය න්‍යෂ්ටික අවි නිෂ්පාදනයට අවශ්‍ය යුරේනියම් බලගැන්වීමේ සහ බැර ජලය පරීක්ෂක ප්‍රතික්‍රියා මධ්‍යස්ථානයක් ගොඩ නැගීම පිලිබඳව නව සම්බාධක පනවමින් හතරවන යෝජනාවක් සම්මත කලේය. එක්සත් ජාතීන්ගේ යෝජනාවට අනතුරුව යුරෝපා සංගමය එහි බලශක්ති ක්ෂේත්‍රය තුල ආයෝජන වැලැක්වීම ඇතුලුව තවදුරටත් තදබල සම්බාධක පැනවීය.

ඉරාන පාලනය නැවත නැවතත් තමන්ට න්‍යෂ්ටික අවි සෑදීමේ සැලසුමක් නොමැති බවද එක්සත් ජාතීන්ගේ සහ ඇමරිකානු සම්බාධක නීති විරෝධී යයි කියා සිටියේ ය. ඉරානය විසින් අත්සන් කරන ලද (එන්පීටී) න්‍යෂ්ටික බලගැන්වීම සීමා කිරීමේ ගිවිසුමේ වගන්ති අනුව රටවලට සාමකාමී අරමුනු න්‍යෂ්ටික ඉන්ධන චක්‍රයේ යුරේනියම් බලගැන්වීම සහ ප්ලූටෝනියම් සැකසීමට අයිතියක් ඇත. නටාන්ස් යුරේනියම් බලගැන්වීමේ මධ්‍යස්ථානය ඇතුලුව ඉරාන න්‍යෂ්ටික නිෂ්පාදක මධ්‍යස්ථානය නිරන්තරයෙන් ජාත්‍යන්තර න්‍යෂ්ටික බලශක්ති ඒජන්සියෙන් පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. ඒ පරීක්ෂනවලට අනුව යුද කටයුතු සඳහා නොවන බවට සහතික වන පිරිසිදු කරන ලද න්‍යෂ්ටික ද්‍රව්‍ය තොගයක් ද පරීක්ෂාවට භාජනය වේ.

යුරෝපා සංගමය හා එක්සත් ජාතීන්ගේ සංගමයේ යෝජිත තහන්චි වලටත් වඩා තීව්‍ර වූ තහංචි ඇමරිකානු නීති මගින් පනවා ඇත. චීනය හා රුසියාව ඒවාට එකඟ වී ඇත්තේ වොෂින්ටනයේ බලපෑම නිසා මිස කැමැත්තෙන් නොවේ. පිරිපහදු පෙට්‍රෝලියම් නිෂ්පාදන ඉරානය විකිනීම සීමා කලහොත් එය ඉරාන ආර්ථිකයට මහත් ලෙස බලපානු ඇත. ඉරානය

තමන්ගේ මූලෝපායාත්මක සංචිත ගොඩනගමින් හා වැඩිදියුනු කරගනිමින් සිටිය ද තමන්ට උවමනා ඉන්ධන තොගවලින් සියයට 25-30 දක්වා ප්‍රමානයක් ජාත්‍යන්තර වෙලඳ පොලෙන් මිලට ගනු ලබයි.

මෙම නීතිවල පූර්න ව්‍යසනය මීටත් වඩා වැඩිය. ඩිමොක්‍රැටික් පක්ෂයේ රොන් ක්ලේන් නම් කොන්ග්‍රස් සභිකයා වෝල්ස්ට්‍රීට් සඟරාවට කීවේ, 'විදේශ කොම්පැනි තීරනයක් ගත යුතු ය. ඔවුන්ට ව්‍යාපාර කටයුතු කලයුත්තේ අප සමඟ ද ඉරානය සමග ද ?' එක්සත් ජාතීන්ගේ යෝජනා අනුව තහනම් නොකරන විදේශ බැංකු සහ සමාගම්වල කටයුතුවලට දඬුවම් කරන බවට තර්ජන කිරීම මගින් මෙම නීතිය ජාත්‍යන්තර විරෝධයට අනිවාර්යයෙන්ම භාජනය වනු ඇති අතර තීව්‍ර කරනු ඇත.

පසුගිය සතියේ ප්‍රන්ස තෙල් සමාගමක් වන ටෝටල් ඉරානයට ඉන්ධන විකිනීම නැවැත්වූ අතර ඉරානයේ දකුනු පාර්ස් ගෑස් නිධිවල සංවර්ධන කටයුතුවලින් රෝයල් ඩච් ෂෙල් කොම්පැනියත් සමග ස්පාඤ්ඤයේ රිප්සෝල් සමාගම ඉරානය සමග තිබූ කොන්ත්‍රාත්තුවකින් ඉවත් වූහ. ටෝටල් කොම්පැනියේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂ ක්‍රිස්ටෝප ද මාර්ජරී ආර්ථික සංසදයකට කීවේ "දේශපාලන සම්භවයක් ඇති ප්‍රශ්න විසඳීමට පෙට්‍රෝලියම් නිපැයුම් විකිනීම නැවැත්ම හොඳ දෙයක් වේ යයි අප සිතන්නේ නැහැ"; ඔහු වැඩිදුරටත් කීවේ "මෙම දිනවල බොහෝ දේවල් දේශපාලනීකරනය වී ඇත."

ඇමරිකාව තුල ද, ජාතික විදේශ වෙලඳ සංගමය සහ අමෙරිකානු එන්ගේජ් සභාග සමාගම සහ ඒවායේ විදේශීය උප සමාගම්වල ක්‍රියාවන් නිසා එක්සත් ජනපද මධ්‍යගත සමාගම්වලට තහංචි වැටීම ගැන තම අප්‍රසාදය පල කලේ යː "මෙම නීති ගෙන ආ කාලපරිච්ඡේදය හා නීත්‍යානුකූල ජාත්‍යන්තර වෙලඳාමට ඇති විය හැකි ප්‍රතිඵල ගැන අපි මහත් කනස්සල්ලට පත්වී සිටිමු."

ටෝටල් කොම්පැනිය ඉරානයට ඉන්ධන විකිනීමෙන් ඉවත් වූ අලුත්ම සමාගමයි. පසුගිය මාස හය තුල, රුසියාවේ ලුක්ඔයිල්, ඉන්දියාවේ රිලායන්ස් කොම්පැනිය, මැලේසියාවේ පෙට්‍රොනාස්, රෝයල් ඩච් ෂෙල් සහ ස්විස් සමාගමක් වූ ග්ලෙන්කෝර් යන මේ සියල්ල පෙට්‍රෝලියම් භාන්ඩ විකිනීම නැවැත්වූයේ ය. ඒත් එක්කම රජය සතු ජාතික පෙට්‍රෝලියම් සංස්ථාව සහ චීන පෙට්‍රෝලියම් ඇන්ඩ් කෙමිකල් සංස්ථාව ද ඇතුලුව ප්‍රධාන චීන සමාගම් කිහිපයක් වසර මුලදී ඉරානයට ඉන්ධන විකිනීම වැඩි කල බවට වාර්තා පල වී ඇත.

මෙම නීතිය යටතේ ඉරානයට විරුද්ධව එක්සත් ජාතීන්ගේ යෝජනාවලට පිටුබලය සැපයූ චීනය වැනි රටවල් ඉන් මුදා හැරීමට පිලිවන. චීනය එක්සත් ජාතීන්ගේ සම්බාධකවලට එකඟ වූයේ ඒවායින් ඉරානයේ ඉන්ධන ක්ෂේත්‍රය ඉවත් කලහොත් පමනි. චීන සමාගම්වලට එරෙහිව ඔබාමා ක්‍රියාමාර්ග ගතහොත් වොෂින්ටනය සහ බීජිං අතර ආතතිය තීව්‍ර වනු ඇත. චීනය ඉරානයෙන් එහි බොරතෙල් අවශ්‍යතාවලින් සියයට 15 දල වශයෙන් ආනයනය කරන අතර ඉරානයේ ඉන්ධන ව්‍යාපෘති ගනනාවක්ම එම වර්ධනය කිරීමට ගිවිසුම් අත්සන් කර ඇත.

එක්සත් ජනපද නව සම්බාධක ඉරානයට විරුද්ධව දිගටම කෙරෙන තර්ජන හා බලපෑම්වල යටි අරමුනු එලිදරව් කර ඇත. 1979 ඉරානයේ ෂා රජු පන්නා දැමීමෙන් පසුව දශක තුනකට වැඩි කාලයක් වොෂින්ටනය ඉරානයට ආර්ථික සම්බාධක පනවා තිබූ නිසා අමෙරිකානු බැංකු හා සංස්ථා මෙම තහංචිවලින් බොහෝදුරට ආරක්ෂා වී ඇත. නමුත් ජපානය, ජර්මනිය වැනි ඉරානය ගැන සැලකියයුතු උත්සුකතාවන් සහිත මිත්‍රශීලී ප්‍රතිමල්ලවයන්ට මෙම ආර්ථික සම්බාධක බලපෑමක් ඇති කරනු ඇත.

පසුගිය බ්‍රහස්පතින්දා වෝල් ස්ට්‍රීට් සඟරාව පෙන්වා දුන්නේ "නීතියේ අභියෝගයට සහ දඩ මුදල් ගෙවීමට සිදුවන බැංකු අතර ජපානයේ මහ බැංකු තුනක් - මිට්සුබිෂි යූඑෆ්ජේ මූල්‍ය සමූහය, සුමිටෝමෝ මිට්සුයි මූල්‍ය සමූහය මිසුහෝ මූල්‍ය සමූහය - මෙන්ම කොමර්ස් බැංකුව, ඒබී බැංකුව, ඩොයිෂ් බැංකුව වැනි යුරෝපා සමාගම් ද තිබේ." මේ සියල්ල ඉරානය සමග ව්‍යාපාර සබඳකම් පවත්වා ගෙන යති. ජපානයේ තෙල් සහ ගෑස් නිෂ්පාදක ඉම්පෙක්ස් ඉම්පෙක්ස් කෝප් සමාගමට ද ඊසානදිග ඉරානයේ ඇස්ඩෙගාන් තෙල් නිධියෙන් සියයට දහයක අයිතියක් ද ඇතුලු තවත් වැදගත් ව්‍යාපාරික සබන්ධතා ඇත.

ඉරානයට විශාල තෙල් සම්පත් ඇතුවා පමනක් නොව මධ්‍යම ආසියාව සහ මැදපෙරදිග අතර මූලෝපායාත්මක අතින් වැදගත් මධ්‍යස්ථානයක පිහිටා ඇත. න්‍යෂ්ටික ප්‍රශ්නය කලාපීය ආධිපත්‍යය සඳහා එක්සත් ජනපදයේ අභිමතාර්ථයට වඩාත් පහසු පාලන තන්ත්‍රයක් තෙහෙරානය තුල පිහිටුවීමට පීඩනය යෙදීමට වොෂින්ටනය සඳහා හුදෙක්ම පහසු පිනුම් පිත්තක් පමනි. පසුගිය වර්ෂයේ ජනාධිපති මැතිවරනයට පසුව ඉරානය තුල විරුද්ධ පක්ෂයේ හරිත ව්‍යාපාරයට ඔබාමා දක්වූ සහාය ඉහත කී අරමුනම ගැබ් කරගෙන

තිබුනි.

ඉරානයට ඉන්ධන සැපයීම අවහිර කිරීමට ඇමරිකාව දරන උත්සාහය අන්තරායකාරී තර්කනයක් තිබේ. ඇමරිකානු පුවත්පත්වල පලවුන ලිපි කීපයකටම අනුව ඉරානය සමග ඉන්ධන වෙලඳාමේ යෙදෙන මහා පරිමාන සංගත එම වෙලඳාමෙන් ඉවත් වූවත් ජර්සියන් බොක්කේ ක්‍රියාන්විත තම කලුකඩ ඔස්සේ ඉරානයට ඉන්ධන - වැඩි මිලකට - ලබාගත හැක. මූල්‍ය බාධක මගින් ඉරානය දන නම්මාගත නොහැකි වුවහොත් යුද්ධමය සම්බාධක නිසැකවම තීව්‍ර කෙරෙනු ඇත.

හිටිපු ජනාධිපති බුෂ් මෙන් ඔබාමා ද ඉරානයට විරුද්ධව එහි න්‍යෂ්ටික මධ්‍යස්ථානවලට ගුවන් ප්‍රහාර එල්ල කිරීමට ඉඩ ඇති බව කියා ඇත. ජාත්‍යන්තර වශයෙන් යුද ක්‍රියාවන් ලෙස සැලකෙන මිලිටරි බලය හරහා ඉරානයට විරුද්ධව සම්බාධක පැනවීමට උත්සාහ කලහොත් පර්සියානු ගල්ෆ් ප්‍රදේශය තුල පුපුරන සුලු තත්වයක් නිර්මානය වනු ඇත.

© www.wsws.org